**සොරණාතොට ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින දීද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-----------------------

ගිණුම් තැබීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) බෝලියද්ද ජල ව්‍යාපෘතියේ ණයහිමියන් සඳහා රු.175,000 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ කෝවිල කඳුර ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුවල රු.26,500 ක ලැබිය යුතු ජල ගාස්තුවක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරිකවල වටිනාකම රු. 778,723 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොලිය රු.420,391 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද රු.434,000 ක් වූ ගැල්වනයිස් කොඩි කණු 225 ක වටිනාකම රු.222,417 ක් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) 2014 වර්ෂයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාව වෙත ලද රු.265,000 ක් වූ බහුකාර්ය ජංගම කුටි 10 ක්, ජංගම කුටි 07 ක් ලෙස රු.185,500 ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) ඇස්තමේන්තු අනුමත වී නොමැති කර්මාන්ත 07 ක වටිනාකම රු.1,551,273 ක් කර්මාන්ත ණයහිමි ලෙස දක්වා තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි කරන ලද කාර්යාල උපකරණ 06 ක වටිනාකම රු.37,050 ක් වත්කම් ගිණුමෙන් ඉවත්කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ මත කාර්යාල ගබඩාවේ ඌණතාව රු.50,550 ක වටිනාකම අයිතම් 09 ක් වත්කම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 15,451,452 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.16,663,925 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 689,703,238 ක වත්කම් විෂයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) හා (ඔ) | අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව ද්‍රව්‍ය ආධාර සඳහා අවස්ථා 7 කදී රු.93,340 ක් ගෙවීම් කර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 2016 වර්ෂයට අදාලව ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 104 | අංක 252-6370 දරන කැබ් රථයෙහි 2015 ජනවාරි 06 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ලබාගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ. 371 | 2014, 2015 හා 2016 වර්ෂවලදී ලබාදුන් තත් කාර්යය අතුරු අග්‍රිම රු.1,035,092 ක් පියවා නොතිබුණි. |
| (iii) මු.රෙ. 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම් නොකළ රු.11,724 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 571 | වසර 02 ක කාලයක් ඉක්මවූ රු.90,692 ක තැන්පත් ශේෂ 16 ක් නියාදනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1:6 වගන්තිය | ස්ථාන මාරුවීම් ලැබූ සේවකයින් දෙදෙනෙකු ගෙන් රු18,230 ක් දීර්ඝ කාලයක සිට අයකර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,210 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,704,357 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2016 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 8 සිට සියයට 56 පරාසයක පැවතුණි.

#### 2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ සහ මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 1,600,000 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මාසික අනුමත දින ගණන ඉක්මවා සභා ලේකම් සහ කාර්මික නිලධාරීට නිවාඩු දින වැටුප් වශයෙන් අවස්ථා 11 කදී රු.50,449 ක් ගෙවීම් කර තිබුණි.

### 3.2 හඳුනාගත් අලාභ

නියමිත කාලය තුළ වාහන ආදායම් බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් වර්ෂය තුළදී වාහන 05 කට රු.11,690 ක් දණ්ඩන ලෙස ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

2016 වර්ෂයේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) තොග පාලනය
(ඇ) ආදායම් අයකර ගැනීම
(ඈ) වාහන පාලනය